රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 04/2019

මගේ අංකය : EST-1/MISCL/06/0032(I)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2019.12.27

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## 2020 වසර - රාජකාරි කටයුතු ඇරඹීමට සමගාමීව ජාතික රුක් රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම

"හැදෙන රටට වැඩෙන ගසක්" විශේෂ ජාතික රුක් රෝපණ වැඩසටහන - 2020 මැයෙන් වූ පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශ ලේකම්ගේ අංක MMDE/06/FR/06/30 හා 2019.12.26 දිනැති ලිපිය සහ "2020 වසර - රාජකාරි කටයුතු ඇරඹීම" මැයෙන් වූ 2019.12.23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 38/2019 වෙත අවධානය යොමු කරවමි.

02. 2020 ජනවාරි මස පළමු වන බදාදා දින රාජකාරි ආරම්භ කිරීමේ වැඩසටහනට සමගාමීව පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙහි උපදෙස් පරිදි ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමෙන් විශේෂ ජාතික රුක් රෝපණ වැඩසටහන ද ක්‍රියාත්මක කරන මෙන් මෙයින් උපදෙස් දෙමි.

03. මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත් - ගරු පළාත් ආණ්ඩුකාරවරුන්